

# සිහින සුරංගනාවී

ටෂ්නි පිතේන්‍යා මඩගම්මන
මහාමායා බාලිකා විද්‍යාලය
1 ශ්‍රේණිය

# සිහින සුරංගනාවී

කර්තෘ :
**ටෂ්නි පිතේන්‍යා මඩගම්මන**
12/31 B , නිදහස් මාවත , පාරමී කුලතුංග මාවත , මහනුවර .

email address : tashnijithenya2017@gmail.com



මගේ නම ටෂ්නි පිතේන්‍යා මඩගම්මන . මම ඉගෙන ගන්නේ මහාමායා බාලිකා විද්‍යාලයේ එක වසරේ. මම පොත් කියවන්න ගොඩක් ආසයි, මේ මම ලියපු පළවෙනි කතා පොතයි. මම තවත් පොත් ලියන්න ආසාවෙන් ඉන්නවා...

ප්‍රකාශනය :
**මහාමායා බාලිකා විද්‍යාලය**
(624-206)

ISBN : ISBN 978-624-206-808-4
Bar Code : 9 786242 068084

## පිදුම

මගේ ආදරණීය

අම්මාට, අප්පච්චිට, අත්තම්මාට, නංගිට, අයියාට

සහ

පන්ති භාර වසනා ගුරු මෑණියන්ට ආදරයෙන්

පුදමි

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

ඔයාල දන්නවද මේ ලෝකයේ පුංචි සුරංගනාවියො ඉන්නවා කියල?

ඔව්, ඇත්තටම එයාල අපේ ලෝකෙට ඇවිත් අපි දිහා බලාගෙන ඉන්නවා. හොඳ ළමයින්ට උදව් කරනවා.



මේ ඉන්නේ සිහින සුරංගනාවි. එයා තමා පුංචි අපේ ලස්සන හීන ඇත්ත කරන පුංචි සුරංගනාවී.

සිහින සුරංගනාවී එයාගෙ ලස්සන රෝසපාට අත්තටු වලින් ඉගිලිලා යනවා.



පුංචි ළමයි ඉන්න ගෙවල් වලට ගිහින් එයාලා මොකද කරන්නේ බලනවා. පුංචි අපේ හීන වලට එබිලා බලනවා. ඒ හීන ඇත්ත කරනවා.

මේ ඉන්නේ රෝසි. එයා ලස්සන රෝස මලක් වාගේ. දවසක් පුංචි සුරංගනාවි රෝසිගේ ගෙදරටත් ඉගිලිලා ආවා.



රෝසි නිදාගෙන ඉන්න වෙලාවේ එයාගේ හීන වලට එබිලා බැලුවා .



සුරංගනාවී දැක්කා රෝසි ලස්සන බෝනික්කෙක් ගැන හීන දකිනවා කියල.

එත් සිහින සුරංගනාවීට රෝසිගේ හීන ඇත්ත කරන්න බැහැ . ඒ ඇයි  දන්නවද?

එයාට බලයක් නැහැ වැරදි කරන නරක ළමයින්ට උදව් කරන්න. එයාලගේ  හීන ඇත්ත කරන්න.




රෝසි කරන එකම නරක දේ තමයි,

හැමදාම උදේට ඉස්කෝලෙ  යන්න ලෑස්ති වෙනකොට කම්මැලිකමට "මට ඉස්කෝලෙ යන්න බෑ " කියල අඬන  එක.

මේක දැකපු සිහින සුරංගනාවී රෝසිට  කිව්ව,

"රෝසි ඔයා හොඳ ළමයෙක් වෙන්න , අම්මාට උදේට කරදර කරන්නේ නැතිව තනියෙන් ඉස්කෝලෙට යන්න ලෑස්ති වෙන්න. අසාවෙන් ඉස්කෝලේ ගිහින් හොඳට ඉගෙනගන්න" කියල.



එදා ඉඳන් රෝසි සුරංගනාවී කියපු විදිහටම,
අම්මට උදේට කරදර කරන්නේ නැතිව
තනියෙන් ඉස්කෝලෙට යන්න ලෑස්ති වුණා.
අසාවෙන් ඉස්කෝලේ ගියා. හොඳට
ඉගෙනගත්තා.





ඔන්න එක දවසක් මේ සිහින සුරංගනාවී රෝසි ළඟට අවා. රෝසිට ගොඩක් පුදුමයි .

සුරංගනාවී රෝසිට එයා  සිහිනෙන් දැකපු ඒ ලස්සනම ලස්සන බෝනික්කව ගෙනල්ලා දුන්නා.

රෝසිට ගොඩක් සතුටුයි. ඒ බෝනික්කට රෝසි "පිංකි" කියල නමක් තිබ්බා.

පිංකි රෝසිත් එක්ක කතා කරනවා. එදා ඉඳන් රෝසිගේ හොඳම යාළුවා තමා පිංකි . හැබැයි ඊට පස්සේ කවදාවත් රෝසි සිහින සුරංගනාවිව නම් දැක්කේ නැහැ .



එත් රෝසි දන්නවා සිහින සුරංගනාවී අහසින් ගිහින් පුංචි ළමයන්ගේ හීන සැබෑ කරන්නවා කියල.



යාලුවේ ඔයාලත් සිහින සුරංගනාවීව දැක්කද?

තවම නැද්ද ... ?

එහෙමනම්

තව ටිකක් හොඳට ඉන්න.

නරක වැඩ කරන්නම එපා.

අම්මා, අප්පච්චි සහ ගුරුතුමී කියන දේ අහන්න.

තව ටික දවසකින් සිහින සුරංගනාවී ඔයාගේ

හීනෙත් ඇත්ත කරාවි.



නිමි ෴

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01